**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**<u>කොළඹ</u>**

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>වතුකරයේ ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය යටතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ බටහිර ඩයගම වතුයායේ ඉදිකරන ලද නිවාස 150ක් ජනතා අයිතියට පත් කිරීම</u>**

2019 ජනවාරි 20 වන දින නුවරඑළිය දිස්ත්‍රික්කයේ බටහිර ඩයගම වතුයායේ පවත්වන ලද විශේෂ උත්සවයකදී ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද නව නිවාස 150 ක් ජනතා අයිතියට පත් කෙරිණ. මෙම අවස්ථාව සඳහා උඩරට නව ගම්මාන, යටිතල පහසුකම් සහ ප්‍රජා සංවර්ධන අමාත්‍ය ගරු පලනි දිගම්බරම් මැතිතුමා, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා, විශේෂ ප්‍රදේශ සංවර්ධන කැබිනට් නොවන අමාත්‍ය ගරු වී. රාධාක්‍රිෂ්ණන් මැතිතුමා හා ඉන්දීය නියෝජ්‍ය මහ කොමසාරිස් ශිල්පක් එන්. අම්බුලේ මැතිතුමා සහභාගී විය.

පාර්ලිමේන්තු මන්ත්‍රීන් හා මධ්‍යම පළාත් සභාවේ සාමාජිකයන්, වැවිලි මානව සංවර්ධන භාරයේ නිලධාරින් (PHDT), UN Habitat ආයතනයේ නිලධාරින්, ප්‍රාදේශීය වැවිලි සමාගම්වල නියෝජිතයින් මෙන්ම බටහිර ඩයගම වතුයායේ වෙසෙන විශාල පිරිසක්ද මෙම උත්සවයට සහභාගී වූහ.

නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා මෙම අවස්ථාවේ කරන ලද ප්‍රකාශය තුළින් අලුත ඉදි කරන ලද නිවාස වල හිමිකරුවන්ට සිය සුබ පැතුම් පිරිනමන ලදී. ඔහු අවධාරණය කරන ලද්දේ ඇමරිකානු ඩොලර් මිලියන 350 ක් (රුපියල් බිලියන 50 කට පමණ ආසන්න) යටතේ ක්‍රියාත්මක ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය ඉන්දීය ආධාර යටතේ විදේශ රටක ක්‍රියාත්මක විශාලතම ව්‍යාපෘතිය බවයි. මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට නියමිත නිවාස 63,000 න් නිවාස 47,000 පමණ මේ වන විටත් ඉදි කර අවසන් බවද එතුමා සඳහන් කළේය.

ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රමුඛතාවයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ඉන්දියාව නිරතුරුවම සහයෝගය ලබා දෙන බව සිහිපත් කළ නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා ඉන්දියානු රජය සහ ජනතාව සාමය හා සමෘද්ධිය වෙත පියමනින ශ්‍රී ලාංකේය ජනතාව සමඟ නිබඳව සිටින බව අවධාරණය කළේය.

****

කොළඹ

2019 ජනවාරි 21